ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 52/ News/ 2013

ක්‍රි. ව. 2013 පෙබරවාරි 04 සඳුදා
05 වෙළුම - 14 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය



## ලංකා අප ස්වාමි දූ ගේ ජාතික බැසිලිකාව තේවත්ත

## 65 වන ජාතික නිදහස් දිනය සමරමු !

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# ලක් මෑණියන්ට කිතුනු අපගේ දායාදය නිතර සිහිපත් කළ යුතුයි.

## ආදරණීය දුවේ පුතේ...

අපි එකම ජාතියක් හැටියට අප උපන් මේ මාතෘ භූමියේ සෛවරී භාවයට, ස්වාධීනත්වයට, භෞමික අඛණ්ඩතාවයට හා නිවහල් බවට නිරන්තරයෙන්ම ගරු කළ යුතු පිරිසක් බව අමතක කරන්න එපා. මේ දිනවල 65 වන නිදහස් සමරුව පවත්වන්නට මුළු දේශයම එකට පෙළ ගැසෙන බව අපි කවුරුත් දන්නවා. එය පැහැදිළිව අපට පෙනෙන්නට තිබෙනවා. ශ්‍රී ලංකා ධජය සෑම ප්‍රසිද්ධ තැනකම, නිවසකම මේ දිනවල ඔසවලා තිබෙන බව දකින්නට පුළුවන්. දේශාභිමාන ගීත සහ ශ්‍රී ලාංකේය ජාතියක් හැටියට දේශයට ආදරය කරන්නට ජනතාවක් පෙළ ගස්වන්නට සෑම තැනකම වැඩ සටහන් සම්පාදනය වෙන බවත් අපි දකිනවා.

ආදර දුවේ පුතේ, කිසිම රටක ආගම නිසා ජාතියට ඇති ආදරය, භූමියට ඇති ආදරය අඩු වැඩි වෙන්නට බැහැ. එක සමානව සෑම පුරවැසියෙක්ම උපන් දේශය තුළ තමන්ගේ යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳව හොඳ හඳුනාගැනීමකින් හා පිළිගැනීමකින් ජීවත් විය යුතුයි. ඉතිං මේ ලංකාද්වීපය තුළ උපන් අපිත් ශ්‍රී ලාංකිකයන් හැටියට මේ උරුමය තුළ සැදී පැහැදී ජීවත් වන්නට ඕනා. අදහන ආගම නිසා රටේ දෙවන පංතියේ පුර වැසියන් සේ ජීවත් වන්නට අවශ්‍ය වන්නේ නැහැ. රටේ ප්‍රධාන ආගම හැටියට බුද්ධාගම තුළ වැඩි ජනතාවක් තමන්ගේ විශ්වාස පද්ධතිය රඳවා ඒ තුළ දේශයට ආදරය කරනවා වගේම කතෝලික අපිත් අපේ විශ්වාස පද්ධතිය රකින අතරම උපන් දේශයේ පුතුන් , දියණියන් සේ දේශයේ උන්නතියට , දියුණුවට ඇප කැප වෙමින් එයට ආදරය කරමින්, එය රැක ගනිමින් ජීවත් වන්නට ඕනා.

මෑත අතීතය තුළ කතෝලික අපේ මුතුන් මිත්තන් මේ දේශයේ නිදහස වෙනුවෙන් බොහෝ කැපවීම් කළා. විදේශ ආධිපත්‍යයට නතු වෙලා තිබුනු අප දේශය මුදා ගන්නට එවකට කතෝලික ශ්‍රී ලාංකික ජනතාව අපරිමිත සේවයක් ඉටු කළා. අභාග ්‍යයකට , අද සමහර ඉතිහාස කථා වල මෙය සඳහන් වන්නේ නැහැ. නමුත් අපේ යුතුකමක් තිබෙනවා, මේ දේශයට පණ මෙන් ආදරය කළ, දේශයේ උන්නතිය වෙනුවෙන් මහ පුජා වීමකින් කටයුතු කළ කතෝලික අපගේ විරුවන් වෙනුවෙන් කථා කරන්න. ඔවුන් සිහිපත් කරමින් නිදහස පිළිබඳව කථා කරන මේ කාල වකවානුවේ ඔවුන්ගේ ආත්මයන් වලට නිත්‍ය සුව ප්‍රාර්ථනා කරන්නට.

ආදර දුවේ පුතේ, නිදහස් සටන ආරම්භ කරන්නට මුල පිරූවේ 1919 දෙසැම්බර් මාසයේ පිහිටුවන ලද ''ලංකා ජාතික සංගමය''යි මේ සංගමයේ පළමු සභාපති වරයා බවට පත්වූයේ ශ්‍රීමත් පොන්නම්බලම් අරුණාචලම් මැතිතුමායි. ඔහුට පසුව (1920 නොවැම්බර් 18 වන දින ) එම තනතුරට පත්වූ ක්‍රිස්තු භක්තික ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිතුමන් ලංකා ජාතික සංගමයේ සභාපතිධුරය හිමිකරගත් පළමු සිංහලයා වුනා. ජාතික සංගමය පළමු වරට (ක්‍රි.ව. 1918-1920 ) පත් කරගත් සහ ලේකම්වරු දෙදෙනා අතර ඊ.ටී. ද සිල්වා මහතා බැතිමත් කතෝලිකයෙක්. ඔහු එහි භාණ්ඩාගාරික ධුරය දැරූ පළමුවැන්නාද වුනා. ජාතික සංගමයේ දෙවන වසරේදී එහි එක් ලේකම්වරයකු හැර අන් ප්‍රධාන නිල සියල්ලම ඉසිලුයේ ක්‍රිස්තු භක්තිකයන් විසිනුයි. ප්‍රැන්සිස් ද සොයියා (1925-1926), ඊ.ඩබ්ලිව් පෙරේරා. (1926 -1927) , පී.සී.එස්. (ශ්‍රීමත් ක්ලෝඩ්) කොරෙයා (1932 සිට 1942 දක්වා තුන්වතාවක්) , ජෝර්ජ් ඊ.ද. සිල්වා (නොකඩවා හය වසරක්) මේ ජාතික සංගමය තුළ ක්‍රියා කාරි වුණා. 1917 දී බිහිවූ ''ලංකා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මණ්ඩලයේ'' ප්‍රතිඵලයක් ලෙස බිහිවූ ''ලංකා ජාතික සංගමය'' නිදහස ලබා ගැන්මට ඉටුකළ පුරෝගාමී මෙහෙවරේ ප්‍රධානතැනක් ඉසුලුවේ ක්‍රිස්තියානි බැතිමතුන් බව අපි නිරන්තරයෙන්ම සිහිපත් කළ යුතුයි.

දේශිය කතෝලිකයා කවදත් මේ දේශයට තදින්ම ආදරය කරන්නෙක්. ඒ ආදරය නිසාම හැම ජාතියකම, හැම ආගමකම සහෝදර පිරිස් වෙත සහෝදරත්වයෙන් හැරෙන්නට කතෝලිකයා හට ශක්තියක් තිබෙනවා. මේ දේශය තුළ අපි සිංහල , දෙමළ , මුස්ලිම් , බර්ගර් හැටියට ජාතින් වශයෙන් වෙන්වී උපත ලැබුවත් එක මවකගේ දරු කැලක් සේ මේ මාතෘ භූමියේ පහස ලැබිය යුතුයි. විශ්වාසය තුළ බෞද්ධ, කතෝලික , හින්දු , ඉස්ලාම් වුවත් ඒවායේ වටිනාකම් තුළ පෝෂණය වී දේශය තුළ එහි මිනිස් කමේ හැඟීමට උරදී ජීවත් විය යුතුයි. මේ දේශය තුළ දැයේ දූ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා ගන්නට පාඨශාලා ඇතිකර ඒ අධ්‍යාපනය සඳහා පෙරමුණ ගත්තේ ක්‍රිස්තියානි පූජක පරපුරයි. ඒ සඳහා කතෝලික සභාව ඉටු කළ මෙහෙවර අති විශිෂ්ටයි. ඒ කැපවීම නිසාම ලෝකයේ ඕනෑම තැනක නොබියව ප්‍රඥාව තුළ ශ්‍රී ලංකා දේශයේ නම රඳවන්නට අපේ ශ්‍රී ලාංකේය ජනතාවට ශක්තියක් ලැබී තිබෙනවා.

ආදර දුවේ පුතේ, ජාති හැඟීමක් නිසා ආගම් විරෝධයක් නිසා මේ දේශය තුළ ජීවත් වන එකම සහෝදර ජනතාවක් විරසක වෙනවා නම් එය මහා බරපතළ අභාග්‍යයක්. ගෙවුනු තිස් වසර තුළ එකම දේශයේ ජීවත් වන සහෝදර ජනතාව යුද්ධ කළ හැටි සිතන්නට ලැජ්ජයි, දුකයි. ඒවා සිදු නොවිය යුතු දේවල්. දේශීය කතෝලික ජනතාව ශ්‍රී ලංකා දේශයේ උපන් භූමි පුත්‍රයන් ලෙස ජාතින් හැටියට බෙදෙන්නෙ නැතිව, ආගම් හැටියට බෙදෙන්නෙ නැතිව අතීතයේ සිට අද දක්වා සාමකාමීව ජීවත් වනවා. එය අප දැයට දායාද කළ ඉතා උතුම් දයාදයක්. ඒ සහෝදරත්වය ,නිවහල්ව, සෛවරීව අපි සැම දෙනාම අත් විඳින්ට අවශ්‍යයි. ජාති හැඟීමක් හෝ ආගම් හැඟීමක් තුළ විරසක නොවන තත්ත්වයක් මේ දේශයේ තිබිය යුතුයි. එකිනෙකා එකිනෙකාට ගරු කළ යුතුයි. ආදරය කළ යුතුයි. ඒ හැඟීමෙන් 65 වන නිදහස උපරිමයෙන්ම සමරන්නට අපි හැම කෙනා සමඟම අත්වැල් බැඳගනිමු.

**ශ්‍රී ලංකා මාතාව දිනේවා !**
**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# සුන්දර ළමා ලෝකය



ඕනෑම අයකුගෙන් ජීවිතයේ සුන්දරතම අවධිය මොකක්ද? යන ප්‍රශ්නය නැඟුවොත් ඊට බොහෝ විට ලැබෙන පිළිතුර වනුයේ ''ළමා අවධිය'' යන්නයි. එය ප්‍රායෝගිකව අපට ද එසේමයි. ඉතින් ආදර දුවේ පුතේ, ඔබ දැන් ගත කරන්නේ ඒ සුන්දර ළමා අවධියයි.

ළමා වියේ ''මිහිරි අත්දැකීම්'' ජීවිතය පුරාවටම අමතක වන්නේ නෑ. පාසල් විය ගත කරන ඔබ ඔබේ අනාගත දිවිය ''ලස්සන කර ගැනීමට උවමනා සියළුම දේ උකහා ගන්නේ මේ අවධියේ දී යි. පළමුවෙන් ඔබේ පවුලෙන් ඔබ සුන්දර අත්දැකීම් ලබනවා. දෙමාපියන් ''දුටු දෙවියන්'' ලෙසයි සලකන්නේ. ඔබේ ම සොයුරු සොයුරියන් ගෙන් ඔබේ ජීවිතය සරුගන්වාගැනීමට ඔබ බොහෝ දේ උකහා ගන්නවා. ඒ වගේම පාසලේදී ගුරුවර ගුරුවරියන්ගේ ආභාෂය ඔබට ඉතාම වැදගත්. ශිල්ප ශාස්ත්‍රය වගේම ජීවිතය පොහොණි කර ගැනීමට උවමනා කරන ගුණධර්ම ඔවුන්ගෙන් ඔබේ ජීවිතයට ඒකරාශී වෙනවා.

ඒ වගේම පාසලේ දී මුණ ගැහෙන යහපත් මිතුරු - මිතුරියන්ද ඔබට වැදගත්. වැඩිහිටි කෙනෙක් හැටියට හදිසියේ පාසල් වියේ හොඳ මිතුරෙක් මුණගැහුණොත් එය අපට කොතරම් සතුටක්ද? ඔබත් කවදා හෝ ඒ අත්දැකීම ලබනවා නොඅනුමානයි.

ඉතින් ආදර දුවේ, පුතේ, ඔබේ අනාගත ජීවිතය සරු ගන්වන හොඳ පුරුදු මේ අවධියේ දී ඔබේ ජීවිතයට එක්කර ගන්න. ඔබේ ආදරණීය දෙමාපියන්, ගුරුවර - වැඩිහිටියන්ගේ යහපත් ආදර්ශයන් ඒ සඳහා ඔබට උදව් වේවි.

ඉවසීම, බැහැපත්කම, කෘතවේදී බව, අන්‍යෝන්‍ය දයාව වැනි ලස්සන ගුණාංග ඔබේ ජීවිතය සුන්දර කරනවා නිසැකයි. ඔබේ ඉගෙනීමේ කටයුතු වගේම ''ගුණධර්ම'' වලින් ඔබේ ළමා ජීවිතය වඩ වඩාත් ලස්සන වනවා.

ඒ වගේම ළමා වියේ දී පුංචි පුංචි නිර්මාණ පුවත්පත් සඟරා වලට ලියන්න. විශේෂයෙන් ''ළමා ප්‍රදීපය'' ඔබේ කුසලතා වර්ධනය කර දීමට සැදී පැහැදී සිටිනවා. එයින් උපරිම ඵල නෙලා ගන්න. එයින් තෘප්තියක් ලබන්න ඔබට පුළුවන්.

**රාගම ඩික්සන් ඇන්ටනි මාමා.**

## ළමා නිර්මාණ යොමු කිරීමට ඇරියුමක් !

කුමර නයනජිත් හා ඇන්ටන් ජයසූරියගේ සම සංස්කරණයෙන් එළි දක්වන ''මරණයේ අඳුර බිඳ ජීවනයට එතෙර වීම'' තේමා කරගත් ''කිතු යාත්‍රා'' නොමිලේ බෙදාහරින පාස්කු වාර්ෂිකයේ සත්වන කලාපය සඳහා ළමා නිර්මාණ භාර ගැනේ.

පාස්කුව හා සබැඳි ඔබේ නිර්මාණ ලිපි, කෙටිකතා, කාව්‍ය (සඳැස් / නිසඳැස් ) චිත්‍ර පෙබරවාරි 25 වන දිනට පෙර ඇන්ටන් ජයසූරිය , සම සංස්කාරක ''කිතු යාත්‍රා'' , නො :- 255/ඊ සාම මාවත ,බෝපිටිය පමුණුගම යන ලිපිනයට යොමු කරන්න.ඔබගේ නිර්මාණ යොමු කිරීමේදී ඔබගේ නම, ලිපිනය, ශ්‍රේණිය පාසල , දහම් පාසල , දුරකථන අංකය පැහැදිලිව ලියා එවන්න.




## වත්තල ශා. අන්තෝනි විදුහල

වත්තල ශා. අන්තෝනි විදුහලේ වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උළෙල පසුගියදා විදුහල් ක්‍රීඩාංගනයේදී පැවැත්වුණි. සරත් කුමාර ගුණරත්න මැතිතුමා, හා ආදි සිසු හිරන්ත පෙරේරා මහතා ආරාධිතයින් වශයෙන් සහභාගී විය.

විදුහල්පති ගරු මාල් ප්‍රනාන්දු පියතුමාගේ මඟ පෙන්වීම යටතේ ගරු කෘෂන් පෙරේරා පියතුමා ඇතුළු සංවිධායක කමිටුව විසින් මෙදින කටයුතු සංවිධානය කෙරිනි. **ක්ලැරන්ස් ලෙනාඩ්**

# භාග්‍යයයන්ට අනුව ජීවත් වෙමින් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට උරුමකම් කියමු

**"සිතින් දිළින්දෝ
භාග්‍යවන්තයෝ
දුකින් පෙළෙන්නෝ
භාග්‍යවන්තයෝ
නිහතමානි ගුණ
ඇත්තෝ
භාග්‍යවන්තයෝ
සාමය ඇති කරන දනා
භාග්‍යවන්තයෝ"**



බොහෝ දෙනෙකුගේ මතය අනුව භාග්‍යයක් ලෙස හඳුන්වන්නේ ධනය, බලය, උසස්වීම් , යානවාහන වැනි පුහු ආටෝපයන්ය. නමුත් සුවිශේෂක කතුවර ශු. මතෙව් තුමන්ට අනුව භාග්‍යය යනු, ජේසු තුමාගේ සියලුම දේශනාවල හරයයි. ඒ අනුව ජීවත්වන්නා භාග්‍යවන්තයකු බවයි. එදා කන්ද උඩ දේශනයේදී ජේසුස් වහන්සේ වදාළ මෙම මංගල වාක්‍ය "මකාරියෝ" යන ග්‍රීක නාමයෙන් හඳුන්වනු ලැබුවේය. එහි අරුත "ප්‍රීති ප්‍රමෝද වන්නෝ" යනුවෙනි. මෙම නාමය තුළ ගැබ් වී ඇති අර්ථයෙන්ම අපගේ සිතට භාග්‍යයන් පිළිබඳ යම් අදහසක් ඇතිවේ. ඒ කුමක්දයත් මෙම භාග්‍යයයන්ට අනුව ජීවත් වීමෙන් අපට සතුට හිමි වන බවත් එම සතුටින් ප්‍රීති ප්‍රමෝද වන්නන් බවට පත් විය හැකි බවත්ය. නමුදු අවාසනාවකට මෙන් වත්මන් සමාජයේ බාල , මහලු සියලු දෙනාගේ ජීවිත තුළින් මෙම භාග්‍යයයන් ගිලිහී ගොස් ඇත. නමුත් ක්‍රිස්තියානි දරුවන් වන අප කළ යුත්තේ තව තවත් එම භාග්‍යයන් තම ජීවිතයට එක් කර ගනිමින් අන් අයටද ආදර්ශයක් වීමයි.

"බැගෑ සිතින් දෙවි සරණ පතන්නෝ භාග්‍යවන්තයෝය. ස්වර්ග රාජ්‍ය ඔවුන්ගේය" යන්නෙන් අපට පවසන්නේ බැහැපත් සිතින් යුතුව අප සැමවිටම ක්‍රියා කළහොත් අපට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට උරුමකම් කීමට හැකිබවයි. එම බැහැපත්කමේ ගුණය අප ජීවිත තුළින් ඉස්මතු කිරීමට නම් අප තුළ තිබෙන පුහුමාන්නය, උද්දච්ඡකම, උඩගුව වැනි ගති ලක්ෂණ අප තුළින් ඈත් කර ගත යුතුය. එවිට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට උරුමකම් කීමට අපට හැකිවනු ඇත.

එමෙන්ම "ශෝක වන්නෝ භාග්‍යවන්තයෝය. ඔවුහු සැනසීම ලබන්නෝය." යන භාග්‍ය තුළින්ද අපට පැහැදිලි කර දෙන්නේ දෙවියන් වහන්සේ තුළ ජීවත් වෙමින් අපට කෙතරම් ප්‍රශ්න හමුවුවත් ඒවාට සාර්ථකව මුහුණදීමෙන් අපට සතුටක් අත්වන බවයි. දේව රාජ්‍යයද එවැන්නකි. එහි දක්නට ඇත්තේ සතුට පමණි. එනම් අප නොදැනුවත්වම හෝ එවිට අප දේව රාජ්‍යයට උරුමකම් කියනු ඇත. "නිහතමානි ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු දේශය උරුම කර ගන්නෝය. " මෙහිදී අප කළ යුතු වනුයේ නිහතමානිවීමේ ගුණය අප තුළ ඇති කර ගැනීමයි. එවිට අපට දෙවියන් වහන්සේගේ සදාකල් වැජඹෙන දේශය හිමි වනු ඇත. දෙවියන්ගේ දේශය යනු දේව රාජ්‍යයයි. කිතුනු අප සොයන සදාතන ජීවිතයයි. එමෙන්ම අප සිත් නිර්මල කර ගතහොත් අපට දෙවියන් වහන්සේව දැකිය හැකිය. සිතින් , වචනයෙන්, ක්‍රියාවෙන් අප සිතාමතා හෝ අතපසු වීමෙන් වැරදි කරන අවස්ථා බොහෝය. එවැනි වැරදිවලින් අප වැලකී අපගේ සිත් නිර්මල කරගතහොත් අපට දෙවියන්ව දැකිය හැකිය. මදක් සිතන්න. දෙවියන් වහන්සේව දැකීමට නම් අප ස්වර්ග රාජ්‍යයට පිවිසිය යුතුය. එනම් ඒ සඳහා මාර්ගයක් මෙම භාග්‍යයන් තුළින් අපට උදා කර දෙනු ඇත.

"සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබන්නෝය." මේ අනුව අප සාමයෙන් , සමගියෙන් හා එකමුතුකමින් ක්‍රියා කළ යුතුය. වෛරය, ක්‍රෝධය, පලිගැනීම පසෙකලා සාමයෙන් පිරි ජීවිතයක් ගත කළ යුතුය. එවිට දෙවියන් වහන්සේගේ පුත්‍රභාවය අපට හිමි වනු ඇත. එනම් අප ආදර තාත්තාට හිමි ස්වර්ග රාජ්‍යය එවිට අපටද අයිති වේ. එහි උරුමකරුවන් බවට අප නොදැනුවත්වම පත්වේ. ශු. මතෙව්තුමාට අනුව අවසාන වශයෙන් අපට හෙළිදරව් කරන භාග්‍යය වනුයේ "යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝය. ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය" යන්නයි. මෙහිදී අප සාධාරණයට , යුක්තියට අනුව ක්‍රියා කළ යුතුය. සෑම විටම අයුක්තියට එරෙහිව නැගී සිටීම කිතුනු අපගේ වගකීමයි. එවිට අපට ස්වර්ග රාජ්‍යය හිමි වනු ඇත.

ක්‍රිස්තියානි දරුවන් වන අපි සැමදෙනාම භාග්‍යයන්ට අනුව ජීවත් වීම අපගේ යුතුකමකි. වගකීමකි. එසේ නම් දෙවියන් වහන්සේගේ රාජ්‍යය කරා පිවිසීමට භාග්‍යයන් අප ජීවිත තුළට රෝපණය කර ගනිමින් සැබෑ භාග්‍යවන්තයකු බවට පත් වුවහොත් දෙවියන් වහන්සේට සාක්ෂි දරමින් උන්වහන්සේගේ විශ්‍රාමයට ඇතුළු වී අප ජීවත් වනු නොඅනුමානයි. අප විසින් සිදු කළ යුත්තේද එයමය.

**අජන්දනා නිම්නාදි රොද්‍රිගෝ**
12 ශ්‍රේණිය
සිරිකුරුස විදුහල - ගම්පහ

# උගුරේ ආබාධයෙන් පෙළෙන සැමට සුවය ලබා දෙන

# ශු. බ්ලාසියුස් මුනි තුමා



ආර්මිනියා දේශයේ වංශවත් පවුලක උපත ලද කුඩා බ්ලාසියුස් කිතුනු පවුලක සාමාජිකයෙක් නොවීය. කුඩා කල සිටම මහා උගතෙකු වන ලකුණු පහල කරමින් සිප් සතර හැදෑරූ මොහු තරුණ වියෙහිදීම වෛද්‍ය විද්‍යාව හැදෑරුවේ අසරණ රෝගීන්ට සුවය ලබා දීමේ පිරිසිදු චේතනාවෙනි.

ඉතා දක්ෂ වෛද්‍ය වරයෙක් වූ මෙතුමාට පැහැදිලි වූ එක් කරුණක් වූයේ මිනිසා ශාරීරික වශයෙන් පමණක් නොව ආත්මික වශයෙනුත් රෝගාතුරවී සිටින බවයි. එයින් මිදීමට ඇති එකම මඟ සියලු බලැති දෙවියන් වහන්සේ බව මතක් වීමෙන් පසු තමන් ඇදහූ මිසදිටු ආගම අතහැර දමා කිතුතුමන්ගේ සරණ පතා කිතුනුවෙක් විය.

ඉන්පසු ක්‍රිස්තු ධර්මය හොඳ හැටි දැනගෙන පූජකවරය පතා දෙව්සත් හලට ඇතුලත් විය. එහිදි දේව ධර්මය ගැඹුරට හදාරා දැහැමි දිවියකට කැපවී අනතුරුව ආර්මිනියම් දේශයේ සෙබෙස්තේ නම් නගරයේ රාජගුරුප්‍රසාදි තනතුරට පත්විය.

දුෂ්ට පාලකයකු වූ දියෝගුක්ලෙසියානු අග රජුගේ අණ පරිදි කිතුනුවන් ඝාතනය ආරම්භ කළ කාලයේ අර්පේ නම් උස් කන්දක තිබූ ගල් ගුහාවකට පලා ගිය මෙතුමා දැඩි තපස් ක්‍රියා කරමින් භාවනාත්මක දිවියක් ගත කළේය.

එම කන්ද අවට සැරි සැරූ සිංහ කොටි වළස් වැනි දරුණු වන සතුන් පවා හඬ නොනගා එතුමාගේ භාවනාවට බාධා නොකර හීලෑ කරන සතුන් පරිදි එතැන ලැග සිටියහ.

මෙහිදි සතුන් දඩයම් කිරීමට පැමිණි අග්‍රිකෝලවුස්ගේ මෙහෙකරුවන් මේ බව දැන තම ස්වාමියාට දැන්වූහ. ක්‍රෝධයෙන් හා කෝපයෙන් වියරු වැටුණු අග්‍රිකෝලවුස් මෙතුමා පණපිටින් අල්ලාගෙන එන ලෙස සේනාවක් පිටත්කර යැවීය. එතුමා අල්ලාගෙන යන අතර කරන ලද ප්‍රාතිහාර්යය මගින් එම සේනාවේ කිහිපදෙනකුගේ සිත් දෙවිඳුන් වෙතට හැරවීමට එතුමාට හැකිවිය.

අග්‍රිකෝලවුස් හමුවට ගෙනෙන ලද බ්ලාසියුස් තුමන් ඇමතූ ඔහු කතෝලික ධර්මය අතහැර කලින් ඇදහූ මිසදිටු ආගම වැළඳ ගන්නා ලෙස අණ කළේය. එය තරයේම ප්‍රතික්ෂේප කළ එතුමා දෙවියන් වහන්සේට පමණක් වන්දනා මාන කරන බව ප්‍රසිද්ධියේම ප්‍රකාශ කළේය.

මෙයින් කෝපයට පත් රජතුමා පොලුවලින් ගසා තුවාල සිදු කර සිරකර තබන්නට අණ කරන ලදි. සිරගතවූ මෙතුමා බොහෝ ප්‍රාතිහාර්යය සිදු කොට නොයෙක් දෙනාගේ සිත් දෙවියන් වෙතට හරවන ලදි.

උගුරේ මාළු කටුවක් සිර වී අසාධ්‍ය තත්වයක සිටින කුඩා දරුවකු සුවපත්කර සැම දෙනා විශ්මයට පත් කරන්නට එතුමා සමත් විය.

**මැක්සි ජේ. ප්‍රනාන්දු**



**මාසික සිතිවිල්ල**

“ජනවාරි මාසය” ළමා ප්‍රදීපය,
අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## පළමු තේමාවෙන් තවත් ප්‍රශ්න කිහිපයක් විමසා බලමු.

★ ශුද්ධවූ බයිබලය තුළ මැවීමේ කථා පුවත් දෙකකි.

1. මැවීම කතා පුවත් දෙක අඩංගු ග්‍රන්ථය නම් කරන්න.

2. මැවීමේ කතා පුවත් දෙක අයත්වන සම්ප්‍රදායයන් දෙක නම් කරන්න.

3. පළමු මැවීමේ කථාවේ අඩංගු විශේෂ ලක්ෂණ පහක් ගෙන හැර දක්වන්න.

4. දෙවන මැවීමේ කථාවේ අඩංගු විශේෂ ලක්ෂණ පහක් ගෙන හැර දක්වන්න.

5. දෙවන මැවීමේ කථා පුවතට අනුව දෙවියන් වහන්සේ මිනිසාට කුළු පග තැනැන් වහන්සේ ලෙස කටයුතු කළ ආකාරය කරුණු 5 කින් දක්වන්න.

★ ''පුරාණ ගිවිසුමේ එන වහල්වීමේ හෙවත් නපුර පරදා යහපත ජයග්‍රහණය කිරීමේ සංකේතය නික්මයාමයි''

1. නික්මයාම හැඳින්විය හැකි වෙනත් නම් දෙකක් ලියන්න.

2. නික්මයාම ගමනට පෙර ඊශ්‍රායෙල් ජනතාව ඊජිප්තුවේ කළ කර්මාන්ත තුනක් නම් කරන්න.

3. නික්මයාම ගමනේදී ඊශ්‍රායෙල් ජනතාව දෙවියන් වහන්සේ අත් දුටු අවස්ථා 5 ක් නම් කරන්න.

★ ''දිවැසිවරයකු යනු දෙවියන් වහන්සේගේ තානාපතිවරයාය.''

1. දිවැසිවරයකු හැඳින්විය හැකි වෙනත් නිර්වචනයක් ලියා දක්වන්න.

2. ප්‍රධාන දිවැසිවරු තිදෙනා කවුද?

3. දිවැසිවර කැඳවීමේ පොදු ලක්ෂණ පහ නම් කරන්න.

4. දිවැසිවරුන්ට පැවරුන වගකීම් පහක් ලියා දක්වන්න.

5. වර්තමාන සමාජයට ඔබට දිවැසිවරයකු විය හැකි මාර්ග පහක් ලියා දක්වන්න.

6. ඔබට දිවැසි කැඳවීමට උරදීමේ වගකීම ආරම්භ වුයේ කිනම් දේව ප්‍රසාද නිධානය මගින්ද?

7. ඔබට දිවැසිවරයෙකු ලෙස පැවරී ඇති වගකීම් තුනක් නම් කරන්න.

**ගරු ඩේමියන් පෙරේරා පියතුමා**

# වයික්කාල, සින්දාත්‍රි මාතා දෙව්මැදුරේ දහම් ළමුන්ට ලේඛක වැඩමුළුවක්



හලාවත පදවියේ වයික්කාල මීසමට අයත් සින්දාත්‍රිය, සින්දාත්‍රිමාතා දෙව්මැදුරේ දහම් පාසල් ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් 2013 පෙබරවාරි 10 වන ඉරුදිනදී පැවැත්වේ.

ළමුන්ගේ ලේඛන කුසලතා එළිදැක්වීමේ අරමුණින් දෙව්මැදුරේ සියවස් ජයන්තිය නිමිත්තෙන් වයික්කාල මීසම් සේවක ගරු ෆිලික්ස් කොළඹගේ පියතුමාගේ අදහසකට අනුව මෙය සංවිධානය කෙරේ. ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා මෙය මෙහෙයවනු ලබයි.

# පුනරුදයේ චින්තන විප්ලවය 04
# එම යුගයේ කලාවට බලපා ඇති අයුරු

මේ යුගයේ යුරෝපා සමාජයේ සෑම අංශයකම විශාල පෙරලියක් සිදුවූ නිසා මිනිසුන්ගේ චින්තනයේ අලුත් පිබිදීමක් ඇති විය. මෙහි එක් අංශයක් නම් රෝම හා ග්‍රීක් ශිෂ්ටාචාරය ඉගෙන ගන්නට මිනිසුන් තුළ වූ දැඩි ප්‍රයත්නයයි. එය පුනර්ජීවනය ඇතිවන්නට එක් හේතුවක් විය. ග්‍රීක් ශිෂ්ටාචාරයේ ආභාෂයෙන් මේ යුගයේ ග්‍රික් කලාව ඉස්මතු වී එය ක්‍රිස්තියානි කලාව හා සම්මිශ්‍රණයවී මධ්‍යතන යුගයේ කලාවට වඩා අලුත් මුහුණුවරක් දිස්විය. පුනර්ජීවන කලාවක් බිහිවුයේ මේ අයුරින්ය.

පුනර්ජීවන යුගය මිනිසාට මුල් තැනක් දෙමින් පුද්ගලයා සම්බන්ධ අමුතු හැඟීමක් දියුණු වෙමින් ආ යුගයකි. එනම් පෞද්ගලිකත්වය ප්‍රධාන විය. ග්‍රීක් කලාවේ පුද්ගලයා දෙවියෙක් ලෙස සලකා රූප නිර්මාණය කළහ. මධ්‍යතන යුගයේ ක්‍රිස්තියානි කලාව තුළ පුද්ගලයාගේ පෞද්ගලිකත්වය පෙන්වීම එතරම් වැදගත් නොවුවත් ග්‍රීක් කලාවේ ආභාෂය නිසා පුනර්ජීවන යුගයේ පුද්ගලයන්ගේ ප්‍රමුඛත්වය ඉස්මතු කර කලාව තුළින් පෙන්වන ලදී.

මේ යුගයේ මිනිසාට මුල් තැනක් දී යට ගිය ග්‍රීක කලාව පණ ගැන්වූයේ පෙට්‍රා නම් තැනැත්තාය. ඔහු පළමුවෙන් කලාව තුළින් පෞද්ගලිකත්වය යන අදහස ඉදිරිපත් කළහ. එමෙන්ම ඔහු තවත් අදහසක් ප්‍රකාශ කළහ. එනම් මානුෂිකත්වයයි. මධ්‍යතන යුගයට වඩා පුනරුද යුගයේදී මෙම අදහස් කලාව තුළින් ඉස්මතු වීම එම යුගයේ විශේෂ ලක්ෂණයකි. හැම දෙයක් ගැනම තර්කානුකූලව සිතීම එකල දක්නට ඇති තවත් ලක්ෂණයක් විය. මිනිසුන් තුළ මෙවැනි අදහස් ඇති වීමෙන් චින්තන විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙන් පුනර්ජීවන යුගයේ මෙවැනි කලා නිර්මාණ බිහිවිය.

මේ යුගයේ වෙළඳාම දියුණු වූ නිසා වානිජමය අංශ ප්‍රබලවී වෙළඳ ව්‍යාපාර දියුණු විය. මුලින් තිබූ සහානිතීය කඩාගෙන ආර්ථික අතින් නිදහස් ව්‍යාපාර ගෙන යන්නට පුරුදු විය. එමෙන්ම අධ්‍යාපනික අතින්ද වෙනස්කම් ඇති විය. ක්‍රිස්තියානි ධර්ම සිද්ධාන්ත ඉගැන්වීම වෙනුවට වානිජ ගණිතය දේශපාලනය, නීතිය ආදි විෂයයන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත් අංශ විය. මන්ද දිනෙන් දින දියුණුවන ආර්ථික අවශ්‍යතා නිසා වානිජමය රටාවකට අනුකූල අධ්‍යාපනයක් බිහිවිය.

මෙම සමාජමය වෙනස්කම් නිසා මධ්‍යම පංතියක් ඇති විය. මෙකල නොයෙකුත් නිර්මාණ ආදිය කළෙත් මෙම මධ්‍යම පංතියේ අයයි. එම නිසා දේවස්ථාන වල අඳින ලද නොයෙකුත් චිත්‍ර, රූප ආදිය මධ්‍යම පංතිකයන්ගේ අදහස් අනුව බිහිවිය. මේ කාලයේදී ග්‍රීක රෝම ශිෂ්ටාචාරය අධ්‍යාපනයේ විශේෂ තැනක් ගත්තේය. එමෙන්ම තුර්කියේ බයිසන්ටයින් ශිෂ්ටාචාරය මේ යුගය වන විට යළිත් වර්ධනය වෙමින් තිබිණි. පුනර්ජීවන යුගය මෙම ශිෂ්ටාචාරවල එකතුවක් වූ නිසා විවිධ අදහස් එකට ගැටෙන්නට පටන් ගනී. මේ අනුව විශාල දේවස්ථාන ගොඩ නගන්නට මෙකල විශාල උනන්දුවක් දැක්විය.



ඉතාලියේ බෲන ලෙශ්චි , යුරෝපයේ ලස්සනම දෙව් මැදුරු සෑදීමේ ප්‍රමුඛ විය. ගියොටෝ සහ ඩර්කක්නා නම් සිත්තරුවෝ එම දෙව් මැදුරු වල චිත්‍ර ඇන්දෝය. එමෙන්ම එකල එහා මෙහා ගෙනයා හැකි කුඩා පින්තූරද ඇඳීමට පටන් ගත්තේය. ජිබර්ට් නැමැත්තා මෙකල පිත්තල වලින් භාණ්ඩ සාදන ලදී. ෆ්ලොරන්සි දේවස්ථානයක මොහු විසින් පිත්තල වලින් සාදන ලද ගේට්ටුවක් ඇත.

පුනර්ජීවන යුගයේ මුද්‍රණ ශිල්පය බිහිවීම නිසා අධ්‍යාපනය කාටත් පොදු දෙයක් විය. ආගමික නිකායන් මගින් මුද්‍රණ ශිල්පයේ ආධාරය ඇතිව පොත පත නිකුත් කළේය. මේ අනුව බයිබලය කාටත් කියවන්නට ලැබීමෙන් සභාව තුළ ඇතිවූ නොයෙක් දේව ධර්ම ප්‍රශ්න ප්‍රතිසංස්කරණය කිරීමට අවස්ථාව උදවිය.

**සංස්කාරක පියතුමන් විසිනි**

**ඉතිරිය ලබන සතියේ .....**

# කොච්චිකඩේ
# සාන්ත අන්තෝනි මු

**කොච්චිකඩේ යැයි කී පමණින් අපේ දූ පුතුන්ට සිහිපත් වන්නේ සාන්ත අන්තෝනි සිද්ධස්ථානය නොවේද? ඕලන්ද පීඩන සමය තෙක් වන දීර්ඝ අතීතයකට උරුම හිමිකම් කියන කොච්චිකඩේ සාන්ත අන්තෝනි මුනි කෞතුකාගාරය පසුගිය ජනවාරි 13 වැනිද විවෘත වුණා.**







කොච්චිකඩේ සාන්ත අන්තෝනි පුදබිමට පැමිණෙන්නේ කතෝලිකයන් පමණක් නොවෙයි. කතෝලික, බෞද්ධ, හින්දු හා ඉස්ලාමීය බැතිමතුන් සාන්ත අන්තෝනි මුනිතුමාගේ මධ්‍යස්ථකම පතා පැමිණෙන්නේ මහත්වූ සැදැහැ දහම් සා පිපාසාවකින්. මෙසේ පැමිණෙන ලක්ෂසංඛ්‍යාත බැතිමතුන් ගැන මෑත කාලීන සාක්ෂිය දක්නට ලැබුණේ 2010 වසරේ දෙව්මැදුරේ 175 වැනි ජයන්තිය නිමිත්තෙන් පුරා දින පහක් තිස්සේ සාන්ත අන්තෝනි මුනිදුන්ගේ ශුද්ධවූ ධාතු ප්‍රදර්ශනය කළ අවස්ථාවේ. දිවා රෑ වෙනසකින් තොරව පටු ජාති ආගම් බේදයකින් තොරව මහා ජන ගඟක් ඒ දින පහේ කොච්චිකඩේට ඇදී ආවේ මහ මුහුද ගොඩ ගලන්නාක් මෙන්.

මේ සියලු තත්ත්වයන් මැද සතියේ අඟහරුවාද දිනවලදී කොච්චිකඩේ පුදබිමට ඇදෙන සුවහසක් වන්දනා කරුවන් සතියේ අනික් දිනවලදිත් දක්නට ලැබෙනවා.මේ අය අතර අන්‍යාගමිකයන්ද සිටිනවා. අන්‍යාගමිකයන් තබා කතෝලික ඇතැම් සැදැහැවතුන් පවා සාන්ත අන්තෝනි මුනිදුන් ගැන දන්නේ නැහැ.



මේ තත්ත්වය අවබෝධ කරගත් කොච්චිකඩේ සාන්ත

**සේයා :- සාගර ප**



# දී විවෘත වූ
# ුනි කෞතුකාගාරය







දහම් හරයන් හා ආධ්‍යාත්මික පරිපූර්ණත්වයෙන් පුරවා යැවීම සඳහා මේ කෞතුකාගාරය ඉවහල් කර ගත යුතුයැයි ඉලක්ක කළා.ඉතාමත් කෙටි කාලයක් තුළ ඒ සිහිනය ජයගන්නට හැකිවී තිබෙනවා. සාන්ත අන්තෝනි මුනිඳුන්ගේ ජීවිත කතාව, ප්‍රාතිහාර්යන්, කොච්චිකඩේ ඉතිහාසය ඇතුලු දැනකියා ගත යුතු බොහොමයක් දේවල් ගැන දැනුම හා අවබෝධය ලබා දෙන්නට මේ කෞතුකා ගාරය මුලපුරා තිබෙනවා.

විශේෂයෙන් කොච්චිකඩේ සාන්ත අන්තෝනි පුදබිමේදී සාන්ත අන්තෝනි මුනිඳුන්ගේ මැදිහත්කම පතා යදින සැදැහැවතුන්ගේ ඉල්ලීම් සපිරී ඇති අවස්ථා එමටයි. ඒ පිළිබඳ සාක්ෂින්ද මෙහි දී දැන කියා ගන්නට අවස්ථාව ලැබෙන බවයි දැනගන්නට ඇත්තේ.

මේ කෞතුකාගාරය සැදැහැ දහම් සාපිපාසය නිවාලන අපූරු කෙම්බිමක් වන නිසාම දූලා පුතාලා අම්මලා, තාත්තලා, එක්ක ගිහින් එය දැක බලා ගන්න.හොඳේ.

**ශිරාන් මෛත්‍රී**

**ජයසිංහ**



අන්තෝනි සිද්ධස්ථාන පාලක ගරු ක්ලෙමන්ට් රොසයිරෝ පියතුමා කොච්චිකඩේ පුදබිමට ශ්‍රද්ධාව පෙරටු කරගෙන පැමිණෙන සුවහසක් ජනතාව ආපසු යනවිට දැනුම, අවබෝධය





# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 85

## Much, Very පිළිබඳව තවත් දැනුවත් වෙමු.

much, very යන නාම විශේෂණ (adjectives) ගැන අපි කලින් කතා කරල තියෙනවා. තව ටිකක් අදත් ඒ ගැන දැනුවත් වෙමු.

much, very යන වචන යෙදෙන්නෙ නාම විශේෂණ සමඟ. (adjectives)

ඇත්තෙන්ම මේවා යෙදෙන හැටි ගැන කීමට ස්ථිර රීතියක් නැහැ. ඒත් සාමාන්‍යයෙන් very කියන වචනය යෙදෙන්නෙ යම් adjective එකක තත්ත්වය ගැන කීමට. "බොහෝ" යන අදහස දැක්වීමට.

**නිදසුන්:**

| | | |
|---|---|---|
| **Very** good | - | බොහොම හොඳයි |
| **Very** nice | - | ඉතා කදිමයි |
| **Very** intelligent | - | බොහෝ ඥානවන්තයි |
| **Very** poor | - | ඉතා දුප්පත් |
| **Very** kind | - | ඉතා කරුණාවන්තයි |
| | | යනාදි වශයෙන්... |

ඒත් much යෙදෙන්නෙ ඒ වගේ නාම විශේෂණ එක්ක නෙමේ. <u>සංසන්දනාත්මකව යමක් ප්‍රකාශ කරන නාම විශේෂණ</u> එක්ක තමයි much යෙදෙන්නෙ.

නිදසුන්:-

much wiser than.... වඩා ඥානවන්තයි (යමෙකුට වඩා)
much poorer than... වඩා දුප්පත් (යමෙකුට වඩා)
much stronger than.. වඩා ශක්තිමත් (යමෙකුට වඩා)

බලන්න මේ නිදසුන් වලින් ඔබට පේනව very කියන එකෙයි much කියන එකෙයි වෙනසක් ඇති බව.

**very** <u>කියන්නෙ "බොහෝ" කියන අදහස</u>
**much** <u>කියන්නෙ "වඩා" කියන අදහස</u>

ඔබට මතක ඇති අපි "Positive, Comparative සහ Superlative කියල යම්කිසි නාම විශේෂණයක් ගැන සංසන්දනාත්මකව කතාකරන හැටි අපි කලින් ඉගෙන ගත්තා. **(පාඩම් අංක 60,61 (නොවැ. 16 සහ නොවැ. 23) නැවත බලන්න.)**

කෙටියෙන් මතක් කරන්නම්

| ***Positive*** | ***Comparative*** | ***Superlative*** |
|---|---|---|
| good | better | best |
| bad | worse | worst |
| beautiful | more beautiful | most beautiful |
| strong | stronger | strongest |
| sweet | sweeter | sweetest |

මේ ඉහත positive/Comparative/ Superlative යන අවස්ථා තුනේදී "very" සාමාන්‍යයෙන් භාවිතා වෙන්නෙ positive කොටසේ තිබෙන adjectives සමඟයි. ඒ වගේ "much" යෙදෙන්නෙ Comparative කොටසේ තිබෙන adjectives සමඟයි.

**නිදසුන්:**

| | | |
|---|---|---|
| **Very** bad | - | **much** worse |
| (වෙරි බෑඩ්) | - | (මච් ව(ර්)ස්) |
| ගොඩක් නරකයි | - | ඊට වඩා ගොඩක් නරකයි |
| A **very** strong man | - | **much** stronger |
| (වෙරි ස්ට්‍රෝන්ග්) | - | (මච් ස්ට්‍රෝන්ග(ර්) |
| ඉතා ශක්තිමත් | - | ඊට වඩා බොහෝ ශක්තිමත් |
| A **very** severe storm | - | **much** more severe storm |
| (වෙරි සිවියෙ(ර්) ස්ටෝම්) | - | (මච් මෝ(ර්) සිවිය(ර්) ස්ටෝම්) |
| තද කුණාටුවක් | - | ඊටත් වඩා තද කුණාටුවක් |

<u>අපි වැකි කීපයක් ඇසුරෙන් **very** සහ **much** යෙදෙන හැටි බලමු.</u>

1. Wattala is a large city.
(වත්තල ඉස් අ ලා(ර්)ජ්) සිටි) වත්තල ලොකු නගරයක්.

Colombo is a <u>much larger</u> city than Wattala.
(කලම්බු ඉස් අ මච් ලාජ(ර්) සිටි දැන් වත්තල)
කොළඹ වත්තලට වඩා ගොඩාක් විශාල නගරයක්.

2. Anil walks very briskly.
(අනිල් වෝක්ස් වෙරි බ්‍රිස්ක්ලි) අනිල් ඉතා ඉක්මනින් ඇවිදියි.

Kamal walks <u>much more</u> briskly.
(කමල් වෝක්ස් මච් මෝ(ර්) බ්‍රිස්ක්ලි)
කමල් ඊට වඩා ගොඩක් ඉක්මනින් ඇවිදියි.




දෙහියාගාත ශුද්ධවූ ජපමාල මාතා දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය හා විවිධ ප්‍රසංගය කණුවන මීසම් සේවක හා ජා-ඇල කලාපීය බයිබල් ධර්මෝපදේශ හා අධ්‍යාපන සම්බන්ධීකාරක ගරු ලෙස්ටර් නෝනිස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

දෙහියාගාත මීසම් සේවක හිෂාන්ත පෙරේරා, සහයක මීසම් සේවක ටෙරන්ස් ප්‍රසංග යන ගරු පියතුමන්ලාගේ හා දහම් පාසල් ආචාර්ය මණ්ඩලයේ සංවිධායකත්වයෙන් මෙය පැවත්වුණි. ගරු පියතුමන්ලාට, ගරු පැවිදි සොහොයුරියන්ට දහම් පාසල් දරු දැරියෝ ත්‍යාග ප්‍රදනය කළහ. එම අවස්ථාව මෙහි දැක්වේ.

**ලෝරන්ස් ප්‍රනාන්දු**



හපුගොඩ සා. මරියා දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදනෝත්සවය ප්‍රවීණ රංගන ශිල්පි රිචඩ් මානමුදලි මහතාගේ ප්‍රධානත්වයෙන් පසු ගියදා සා. මරියා විදුහල් ශාලාවේදී පැවැත්විණි.



එදින රිචඩ් මානමුදලි මහතා අතින් සිසුවකු ත්‍යාග හා සහතිකපත් ලබා ගත් අවස්ථාව. මීසම් සේවක ගරු රසික ඉවාන් කුරේ පියතුමාගේ මග පෙන්වීම මත දහම් ගුරු මණ්ඩලය එක්ව මෙය සංවිධානය කෙරිණි.

**ඇන්ටන් ජයසූරිය**

**ඔබ පාසලේ, දහම් පාසලේ සිසු නායක පදක්කම් පැළඳවීම පිළිබඳ තොරතුරු පැහැදිළි සේයාරුවක්ද සමඟ අප වෙත යොමු කරන්න.**

**සිසු නායක පදක්කම් පැළඳවීම,**
**ළමා ප්‍රදීපය, අංක 02,**
**ඥානාර්ථ ප්‍රදීපය මාවත - කොළඹ 08**

# මග්ගොන දහම් පාසලේ සිසුනායක නායිකාවන්ට වැඩමුළුවක්



මෙයට සහභාගී වූ ශිෂ්‍ය නායක නායිකාවන් දැනුම්වත් කරන අයුරු.

මග්ගොන සා. මරියා දහම් පාසලේ 2013 වර්ෂය සඳහා තේරී පත්වූ සිසු නායක නායිකාවන් සඳහා වැඩමුළුවක් පසුගියදා දෙව්මැදුරු ශාලාවේදී පැවැත්වුණි. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක දේශක, කුමර නයනජිත් මහතාය.

මෙයට එක්වූ පිරිසට ශිෂ්‍ය නායකයකු යනු කවුරුන්ද? මොවුන් සතු වගකීම් , තිබිය යුතු වටිනා ගුණාංග ආදි කරුණු රැසක් පිළිබඳව අවබෝධයක් ලබා දුන් අතර අවසානයේදී කණ්ඩායම් සාකච්ඡාවක් හා අභ්‍යාසයක්ද ලබා දුනි.

මග්ගොන මීසම් සේවක ඉෂාන් ප්‍රමීන පියතුමාගේ අනුශාසකත්වයෙන් මෙදින කටයුතු සංවිධානය කෙරිණි **(ශිෂ්‍ය නායක මඩුල්ල)**



**ලූර්දු දේව මාතාවන්**

ටෙරන්ස් ක්ලියිව් ඇන්තනී
10 ශ්‍රේණිය
ලූර්දු දේව මාතා
දහම් පාසල
පොල්ගහවෙල



**සමිඳාණන් වහන්සේගේ ස්නාපන මංගල්‍යය**

තිළිණි හර්ෂිකා රුද්‍රිගු
12 ශ්‍රේණිය
සාන්ත මරියා
දහම් පාසල
උස්වැටකෙයියාව



**වනාන්තරයේ අසිරිය**

ශවින් කිත්ම
07 ශ්‍රේණිය
ශු. මිඛායෙල් දහම් පාසල - නාගොඩ, කළුතර




පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංති භාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**දවසක උදව**

අදීෂා නිහාරි ෆොන්සේකා
01 ශ්‍රේණිය
ජයලත් අප ස්වාමිදුවගේ කන්‍යාරාමය - මොරටුව



**දිය ඇල්ලක්**

ස්වේන් දේදුනු ප්‍රශංසා
2 ශ්‍රේණිය
නිමල මරිය
බාලිකා විදුහල
තුඩැල්ල



**වැසි දිනයක්**

ඉමල්ෂි දුලීෂනා
05 ශ්‍රේණිය
සාන්ත මරියා ප්‍රාථමික
බාලිකා විදුහල
හලාවත

# ආදර දෙව් සමිඳේ ......

ඉමක් කොනක් නොපෙනෙන මහ සයුරු
තෙරක්වන් මේ ලොව තුළ
ජීවිතය නමැති නෞකාවෙන්
තරණය කරන කල
දියරැළි , කුණාටු , සැඩ සුළං රැල් නම්
අභියෝග, බාධක ඇදවැටීම් වලට
සවිමත්ව මුහුණ දෙනු වස්,
අප ආසිරිගන්වන නිසල දියරැළි
ඔබයි සමිඳුනේ......
හෙට දිනයේ පිපෙන්නට වෙරදරන
පුංචි මල් කැකළුවලට පාර කියන
හිමිදිරියේ අරුණෝදය ඔබයි
සමිඳුනේ.......

**එරන්දි තරුෂිකා සඳරේණු**
11 ශ්‍රේණිය
ක්‍රිස්තුරාජ විදුහල - වැලිවේරිය



පාපි අඳුර නෙත් වසන විට
යායුතු මඟ නොපෙනෙනවිට
ආලෝකය වෙමින් මගෙ දිවියට
යා යුතු මඟ පෙන්වා දුන්
ආදර දෙව් පියාණෙනි
තුති පුදනෙමි
ඔබදුන් සැම දෙයටම

**රොමේන් ෂෙහානි**
09 ශ්‍රේණිය
සිරිහඳ දහම් පාසල - බොල්ලත

සමිඳේ
ඔබ පමණිය දෙවිඳේ
ගී ගයමින් තුති
පැසසුම් දෙමි මම,
ඔබ පමණිය මාගේ රජිඳුනෝ
ගයමි ඔබ හට ගීයක්
අවසර දෙනු මැන සමිඳේ.....

**සඳුනි උරේෂිකා**
12 ශ්‍රේණිය - (වාණිජ අංශය )
ශා. ඉසිදෝරු දේවස්ථානය
තිබ්බටුගොඩ

වැහි පොද වැටුණා
හිරු නැඟ ආවා
නමුත් සමිඳේ මට නෑ දුක දැනුනේ
මගේ හිතට නෑ ඔබ ආවේ
දරන්න බෑ ජේසුනී මා හට වෙන්න - කමා සමිඳේ

මා හද වැලපුනා
ඉකිබිඳ හැඬුවා
කඳුළු වැගිරුණා
පව් හැම හින්දා
දරන්න බෑ ජේසුනී මා හට වෙන්න - කමා සමිඳේ

**දිලක්ෂි බර්ණදෙත්**
10 ශ්‍රේණිය
සියලු සාන්තුවරයන්ගේ බා.ම.වි - බොරැල්ල

මහ ගල්පර මැද්දේ
බාධක සැම ඔස්සේ
ජීවිත මඟ ජය ලබන්න
ජේසුනි මට දිරිය දෙන්න

බාධක සැම බිඳලා
හොඳ ගතිගුණ වැඩිවෙලා
නිරන්තරෙන් ඔබ යදින්න
ජේසුනි මට බලය දෙන්න

**ලක්සලා ප්‍රමෝදි**
09 ශ්‍රේණිය
ශු. මිඛායෙල් දහම් පාසල - නාගොඩ, කළුතර

# ප්‍රහේළිකා අංක 35




සැකසුම

තිළිණී දුතිකා පෙරේරා

**හරහට**

1. මංගලම් කීමට පැමිණි ගාබ්‍රියෙල් දේවදූතයාට මරිය තුමිය පැවසුවේ ''බලන්න මම ස්වාමින් වහන්සේගේ ..... වෙමි. ඔබ පැවසූ ලෙස මට සිදු වේවා'යි යනුවෙනි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

3. ........... වරදවා ගැනීම , පය ලිස්සා වැටීමට වඩා අයහපත්ය'' යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි.

4. මරියතුමියගේ උදන ගීතයේ මෙසේ සඳහන් වේ. සමිඳාණෝ මහා නරපතීන් සිය සිහසුන්වලින් ....හෙලා දීනයන් ඉහල නංවා උසස් කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ක්‍රිස්තුන් වහන්සේ සුවකළ ලාදුරු රෝගීන් දස දෙනාගෙන් උන්වහන්සේට ස්තුති කිරීමට නොපැමිණි සංඛ්‍යාව

7. මෙහි ඉඩකඩ නොමැති වූයෙන් ජේසු බිළිඳුගේ උපත සිදු වුයේ ගවලෙනකය.

**පහළට**

1. මරිය තුමීය දේව මාතාවන් ලෙස තෝරා ගන්නා විට එතුමිය .....රජ පරපුරෙන් පැවත එන ජුසේතුමා හට විවාහ ගිවිසුම් දී සිටියාය. මෙහි හිස්තැනට සුදුසු වචනය

2. මරිය තුමියගේ උදන ගීයේ මෙසේ සඳහන් වේ සමිඳාණන් සාගිනි වුවන්.... දෙයින් සතප්වා ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ස්නාවක ජුවාම් තුමාගේ එක් දේශනයකදී මෙසේ ප්‍රකාශ කළේය. ....... හොඳ හැටි පිරිසිදු කරන පිණිසත් ධාන්‍ය පෙළා සිය අටුවෙහි රැස්කරන පිණිසත් ක්‍රිස්තුන් වහන්සේ අතේ කුල්ල ඇත. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ස්නාවක ජුවාම් තුමා උපදින විට සකරියස්තුමා ගොළු ව සිටිය බැවින් තම පුත්‍රයාට දිය යුතු ......... ගල්ලෑල්ලක ලියා පෙන්වූ බව ශු. බයිබලයේ සඳහන් වේ. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. අප ලෝකයේ ආලෝකය විය යුතු බවත් මිනිස්සු පහනක් දල්වා බඳුනක් ..... නොව පහන් රුකක් මත තබා සියල්ලන්ට එළිය ලබා දෙන බව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.

**(මෙම ප්‍රහේළිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ලුක් 1,2,3,4, 17, 19, උපදේශකයා හෙවත් සිරාක් 20, ශු. මතෙව් 5 )**

# දහම් පාසලට පැමිණි පළමු ශ්‍රේණියේ ළමුන්



**දැලතුර ශු. රෝකුස් මුනි දහම් පාසලට 2013 පළමු ශ්‍රේණියට අලුතෙන් එක්වූ ළමුන් ඇන්තූරියම් මල් පොකුරක් දී පිළිගත් අතර ඔවුන් පංතියේ වාඩිවී සිටින අයුරු මෙහි දිස්වේ.** **ෂෙහාරා පෙරේරා**



**පසුගියදා කඩලාන ශාන්ත අන්තෝනි දහම් පාසලට පළමු ශ්‍රේණියට ළමෝ ඇතුලත් වූහ. දහම් පාසල් තූර්යවාදක කණ්ඩායම පෙරටු කර ගෙන මෙම ළමුන්ව දේවස්ථානය වෙත කැඳවා ගෙන පැමිණි අතර, දෙවන ශ්‍රේණියේ දරු දැරියෝ අලංකාර ස්වභාවික දම් පැහැති මානෙල් මලක් දී පිළිගත්හ.**

**ළමුන් දේවස්ථානයට ඇතුල්වීමට පෙර මීසම් සේවක ගරු ලලිත් පෙරේරා පියතුමන් විසින් දරුවන් පිළිගෙන ආසිරි ගැන්වූ අයුරු.** **සුමිත් මාර්ක් ද සිල්වා**

← **නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්,**
**ප්‍රහේළිකා අංක 35, ළමා ප්‍රදීපය,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

ප්‍රහේළිකා අංක 35 සඳහා පිළිතුරු ලබන සතියේ


රූපී කුමාරයයි කිඳුරු කුමාරියයි
32
කතාව: ආනන්ද කල්දේරා
දෙබස්, චිත්‍ර ඒ.ස්.ජී.ජී. සඳුආරච්චි
ඔන්න ආයෙමත් කුමාරයගෙ යාළු කුමාරවරු නැව ඇතුලෙ කාල, බීල විනෝද වෙන්න පටං ගත්තා ඒ ගොල්ලන්ට හරිම සතුටුයි. ඇයි.. බොහොම කාලෙකට පස්සෙනෙ කට්ටියම ගම්, රටවල් බලා යන්නෙ
මේ අතර නැවේ සිටිනු කුමාරි මුද මැද තියෙන අයිස් කඳු ඈතට පේන නීල වර්ණ මහා මුහුද නිල් අහස දෙස බලමින් හුඟක් සතුටු වුනා..
එසේ බලා සිටින කුමාරි ළඟට කුමාරයත් ළංවුනා....
කුමාරී මොනවද මුද දිහා බලාගෙන.... ..කල්පනා කරන්නෙ..
කුමරුනී.. අර බලන්න ඈත මුහුදෙ ලස්සන මේ හිම කඳු...
ඔයිට වඩා ලස්සන දේවල් මගෙ රටට ගිහාම කුමාරිට දැකගන්න පුළුවන්
මම නම් කවදාවත්ම හිතුවෙ නෑ මට මනුස්ස කුමාරයෙක්ව විවාහ කර ගන්න ලැබෙයි කියල..
මමත් කවදාවත්ම හිතුවෙ නෑ මේ වගේ ලස්සන කිඳුරු කුමාරිකාවක් හිමි-වෙයි කියල..
ඔයා වගේ ලස්සන ගුණයහපත් කුමාරිකාවක් මට ලබාදුන්නට අපි දෙවියන් වහන්සේට ස්තූති කරමු.. අපව සෑම කරදරයකින්ම බේරල මේ වගේ සතුටෙන් අපට ආරක්ෂා වෙන්න ඔබ සළසා දුන් දෙවියන් වහන්සේට ..ස්තූති වේවා..
..ග්‍රෝ !!
හා: හූ
ඕ.. කුමරුනී.. අර ඈත මුහුද මැද්දෙ.. ..මොකෙක්ද.... ..ආ...
ඕ..යක්ෂයෙක්..

ශු. ප්‍රැන්සිස් මුනිඳුන්ගේ
කතාව

# අසීසි නගරයේ දිළින්දා

ඉදිරිපත් කිරීම — ආශල් ද සිල්වා

10

